www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# වසංගත රෝග පිලිබඳ අනතුරු ඇඟවීම් සමග සුනාමි මරන සංඛ්‍යාව 60,000 දක්වා ඉහල නගී

## Tsunami death toll rises to 60,000 amid warnings of epidemics

**පීටර් සිමන්ඩ්ස් විසිනි**
**2004 දෙසැම්බර් 29**

බෙංගාල බොක්කේ මායිම් වලල්ල දිගේ මහා ඛේදවාචකයක් දිග හැරෙමින් පවතී. ඉරුදින උදයේ මුහුදු බඩ ප්‍රදේශවලට කඩා වැදුනු චන්ඩ රල පහරින් බහුතරය දරිද්‍රතාවයෙන් පෙලුනු දස ලක්ෂ ගනන් මිනිසුන්ගේ ජීවිත කඩා බිඳ දමා ඇත. ගනන් බලා ඇති මරන සංඛ්‍යාව 60,000කට ආසන්න වී ඇති අතර ජීවිත බේරා ගැනීමේ සහ සහන කටයුතුවල නිරත වූවන් ප්‍රදේශය මුලුල්ලේ ගම් සහ නගරවල ඉතිරි වී ඇති කැඩී බිඳී ගිය සුන්බුන් පීරමින් සිටින බැවින් ඉහත කී මරන සංඛ්‍යාව තව දුරටත් වැඩි විය හැකි ය.

විනාශ වූ ප්‍රදේශවලට හදිසි ආහාර, ජලය, සහ බෙහෙත් සැපයීම් නො ලැබුන හොත් මරන සංඛ්‍යාව දෙගුනයක් විය හැකි බවට ලෝක සෞඛ්‍ය සංවිධානය (ලෝසෞසං) ඊයේ අනතුරු ඇඟවී ය. ''ව්‍යසනයට පත් ජනතාවගේ දීර්ඝ කාලීන වේදනාවන් මගින් සුනාමි රල පහරේ සහ භූමි කම්පාවේ ක්ෂනික භයංකරත්වය සැලකිය යුතු නොවන තත්වයට පත් කල හැකි බව'' ලෝක සෞඛ්‍ය සංවිධානයේ හදිසි ආපදා අංශයේ ප්‍රධානියා ඩේවිඩ් නබාරෝ පැවසී ය. ලෝක සෞඛ්‍ය සංවිධානය පාචනය, මැලේරියාව වැනි රෝග වාහක ලෙඩ රෝග ද ස්වසන ආසාදනයන් ගැන ද අවධාරනය කොට ඇත.

වඩාත් ව්‍යසනයට පත් ප්‍රදේශවලින් ගන්නා ලද ඡායාරූප සහ සම්මුඛ සාකච්ඡා විනාශයේත් ඛේදවාචකයේත් ප්‍රමානය කොපමන ද යන්න පෙන්වන ක්ෂනික දර්ශන සපයයි. සමස්ත ජන සමූහයන් ම සහමුලින්ම විනාශ කොට දමා ඇත. නිවාස සහ පැල්පත් විනාශ වී තිබේ. මෝටර් රථ, වාහන පැත්තකට වීසි වී ඇත. යටිතල පහසුකම් සුනු විසුනු වී ගොසිනි. වීදිවල මල සිරුරු ගොඩ ගැසී ඇත. මියගියාහු සමූහ මිනී වලවල්වල මිහිදන් කෙරෙති. රෝහල්වල ඇත්තේ ව්‍යාකූල තත්වයකි. ශෝකයට පත් නෑදෑයෝ තම ස්නේහවන්ත නෑ හිත මිතුරන් සොයමින් සිටිති. සෙස්සෝ මිය ගිය අය ගැන ශෝක වෙති.

වඩාත්ම ව්‍යසනයට පත් ඉන්දුනීසියාව, ශ්‍රී ලංකාව, ඉන්දියාව, සහ තායිලන්තය යන රටවල තවමත් විශාල වසයෙන් මල සිරුරු හමුවේ. ගමනාගමනයට හා පනිවුඩ හුවමාරුවට බරපතල හානි සිදු වී ඇත. සුනාමි රල පහරින් දින 4 කට පසු හදිසි සේවා කන්ඩායම් ඉතා ඈත පිහිටි ගම්මානවලට සහ ප්‍රදේශවලට ලඟාවීමට තවමත් උත්සාහ කරමින් සිටිති. බරපතල ආහාර හිඟය, බෙහෙත් සහ පිරිසිදු ජලය හිඟකම හේතුවෙන් තවත් මරන රැල්ලක් ඇති වීමට ඉඩ ඇති බවට කලාපය සෑම තැනකම සහන සේවකයෝ සහ ආධාර සපයන ආයතන අනතුරු අඟවති.

මරනය සහ විනාශය සමග ධෛර්ය සහ ත්‍යාගශීලි බව ඉස්මතු කර පෙන්වන අවස්ථා ද ඇත. සාමාන්‍ය ජනතාව - ව්‍යසනයට පත් රටවල - ස්වදේශිකයන් හා සංචාරකයන්, ගැමියන් හා කම්කරුවන් මෙන්ම වෘත්තිකයන් දෙස සෙසු රටවල සිට ත්‍රස්තව ව්‍යසනය දෙස බලා සිටි ජනයා ද - ව්‍යසනයට පත් වූ අයට උදවු කිරීම සඳහා තම කාලය සහ මුදල් වැය කරමින් ද සමහර අවස්ථාවල සැලකිය යුතු පෞද්ගලික කැපකිරීම්වල නිරත වෙමින් ද, ඛේදවාචකයට ප්‍රතිචාර දැක්වූහ.

ඊට හාත්පසින් ම වෙනස්ව ආසියාවේ හා ජාත්‍යන්තරවත් පාලක රාජ්‍ය තන්ත්‍රයන්ගේ ප්‍රතිචාරය මන්දගාමී සහ අප්‍රමානවත් විය. සුනාමි රල පහර ඇති වීමට හේතු වූ විශාල භූමිකම්පාවේ ප්‍රමානය එය හට ගත් ස්ථානය සහ වෙලාවත් ඉන් විනාඩි 15 සිට 30 දක්වා කාලයක් තුල දැන ගන්නා ලද වුව ද මෙම ප්‍රදේශයේ රටවලින් එක් රටකවත් ඒ පිලිබඳව ක්ෂනිකව අනතුරු ඇඟවීම් කොට නැත. ඒ සම්බන්ධ කිසිදු පියවරක් ගෙන නැත. ශාන්තිකර සාගරය මෙන් ඉන්දියන් සාගරයේ සුනාමි අනතුරු ඇඟවීමේ පෘථුල පද්ධතියක් නැත.

ප්‍රචන්ඩ රල පහරත් සමග නිල වසයෙන් සිදු වූ සීමිත සහන සේවය ජීවිත බේරා ගැනීමේ උත්සාහයන් ව්‍යසනයේ පරිමානය මගින් යටපත් කරන ලදි. ප්‍රදේශයේ ආන්ඩු එවැනි ව්‍යසනයකට මුහුන දීම සඳහා සූදානම් තත්වයක නො සිටි අතර මිනිස් බල හිඟකම, සම්පත් සහ සැලසුම් හිඟකම ප්‍රදර්ශනය විය. හදිසි සහන සේවකයින් තමන්ට හැකි උපරිම සීමාව දක්වා නිතරම සෑම අයුරින්ම උත්සාහ ගෙන තිබුන ද, ඔවුන්ට උපකරන සහ සැපයීම් හිඟකම හේතුවෙන් මෙන්ම ඉතා බරපතල ලෙස ව්‍යසනයට පත් ප්‍රදේශවලට ලඟා වීමට තිබූ දුෂ්කරතාවයන් හේතුවෙන් ද ඔවුන්ගේ උත්සාහයන්ට අවහිරතා ඇති විය.

අවශ්‍ය මුදල්, මිනිස් බලය, තාක්ෂනය, උපකරන

සහ විශේෂඥ දැනුම හිමිකරගෙන සිටි ඇමරිකා එක්සත් ජනපදය, යුරෝපා හවුල, ඔස්ට්‍රේලියාව සහ ජපානය ක්‍රියාකර ඇත්තේ ඉතාම කුරිරු උදාසීන බවකිනි. වොෂිංටනය, තෝකියෝව, ලංඩනය සහ කැන්බරාව නීති විරෝධී ලෙස ඉරාකය ආක්‍රමනය කිරීම සඳහාත් එය යටත් කර ගැනීම සඳහාත් ඩොලර් බිලියන සිය ගනනක් නොවේ නම් දස ගනනක් වියදම් කොට ඇත. එහෙත් ආසියාවේ මිලියන ගනනක් ජනතාවට ව්‍යසනය ඇති කල විනාශකාරී භූමිකම්පාවට ප්‍රතිචාර වසයෙන් ඔවුන්ගේ ඒකාබද්ධ ආධාරය වී තිබෙන්නේ ආසියාතික රටවල් නැවත ගොඩ නැගීමේ විශාල කර්තව්‍යය කෙසේ වෙතත් එම රටවල ක්ෂනික මූලික අවශ්‍යතා සඳහා වත් කිසි සේත් ප්‍රමානවත් නොවන ඇමරිකානු ඩොලර් මිලියන 100කටත් අඩු මුදලකි.

විපතට පත් වූවන්ගේ අවශ්‍යතා සහ වැදගැම්මකට නැති පරිත්‍යාගවල ප්‍රමානයත් අතර පරතරය කෙතරම් ද යත් එක්සත් ජාතීන්ගේ හදිසි සහන කටයුතු පිලිබඳ සම්බන්ධතා නිලධාරී ජාන් එගලන්ඩ්ට පහත සඳහන් ආකාරයේ පරිස්සම් සහගත නමුත් තියුනු විවේචනයක් නිකුත් කිරීමට බල කෙරී ඇති බව හැඟුනි. ''අප මෙතරම් මසුරු වී ඇත්තේ ඇයි ද යන්න මට තේරුම් ගත නොහැකි ය. සත්තකින්ම නත්තල් සමය තුල බොහෝ බටහිර රටවලට අඩු වසයෙන් අප කොතරම් ධනවත් වී ඇත්ද යන්න මතක් කල යුතුව තිබේ.''

''වර්ධනය වන ලෝක ආර්ථිකය තුල පරිත්‍යාගශීලී කිහිප දෙනෙකුගේ ත්‍යාගශීලී බව පෙරට වඩා හීන වී ඇත.''යි ඔහු ඊයේ පැවසී ය. ''මෑත ඉතිහාසයේ ඛේදජනකම ස්වාභාවික ව්‍යසනය'' ලෙස විස්තර කල මෙම තත්වය තුල අවශ්‍ය කටයුතු කිරීම සඳහා අඩුම වසයෙන් ඇමරිකානු ඩොලර් බිලියන 15ක් අවශ්‍ය වී ඇති බව ඔහුගේ තක්සේරුව විය.

ඇත්ත වසයෙන්ම සපයා ඇති ආධාර මුලුමනින් ම විනාශයට පත් වූවන් ගැන සැබෑ අනුකම්පාවකට වඩා මෙම ඛේදවාචකයේ දේශපාලන ආදීනව සමග සම්බන්ධ වී ඇත. 1923 තෝකියෝවේ මහා භූමිකම්පාවේදී මෙන් මේ පරිමානයේ විනාශයක් තුල දේශපාලන අස්ථාවරත්වය හා විරෝධතාවයන් මුදා හැරීමේ ශක්‍යතාවන් අන්තර්ගත වී තිබේ. මේ සතියේ සිදුවීම් සිදු වීමට පෙර පවා මෙම කලාපයේ ආන්ඩුවල ප්‍රතිව්‍යුහකරන ප්‍රතිපත්තීන් හා පිරිහෙමින් පවතින ජීවන තත්වයන්ට එරෙහිව පුලුල්ව පැතිරී ගිය මහජන විරෝධතාවයන්ට හා උදහසට මුහුන දීමට එම ආන්ඩුවලට සිදු වී තිබුනි. සුනාමි රල පහරේ ප්‍රතිඵලය වූයේ දුගීන් සහ ධනපතීන් අතර තිබූ විශාල පරතරය තව තවත් තීව්‍ර කිරීමත් සමාජ අවශ්‍යතාවයන් මත නොව, ලාභය මත පමනක් පදනම්වූ ආර්ථික ක්‍රමයේ බංකොලොත් බව හෙලිදරව් කිරීමත් ය.

**ශ්‍රී ලංකාව**

ඊයේ රාත්‍රිය වන විට ශ්‍රී ලංකාවේ මරන සංඛ්‍යාව නිල වසයෙන් 18,700 ඉක්මවා තිබූ අතර අදාල නිලධාරීන් එම සංඛ්‍යාව 25,000 දක්වා වැඩි විය හැකි බව අනාවැකි පලකර තිබේ. ප්‍රචන්ඩ උදම් රල පහරට දිවයිනේ උතුරු නැගෙනහිර සහ දකුනු ප්‍රදේශ සෘජුව ගොදුරු වූ අතර කොලඹ අගනගරය ද ඇතුලු බාහිර වෙරල බරපතල ලෙස හානියට පත් වී ඇත. ගම් සම්පූර්නයෙන්ම පොලවට සමතලා වී තිබේ. දකුනු පලාතේ හම්බන්තොට, ගාල්ල හා මාතර වැනි නගර සහ නැගෙනහිර පලාතේ මඩකලපුව ත්‍රිකුනාමලය වැනි නගර බරපතල ලෙස ව්‍යසනයට පත්වී ඇත.

බොහෝ ප්‍රදේශවලට ප්‍රවේශ වීමට නොහැකි තත්වයක් උද්ගතව තිබුනු බැවින් ඇසූ දුටු වාර්තා හිඟ තත්වයක් පැවතුනි. ගාල්ලේ සිදු වී ඇති විනාශය සහ අත්‍යවශ්‍ය සැපයීම් හිඟකම බ්‍රිතාන්‍ය ගුවන් විදුලි සේවයේ වාර්තාවකින් විස්තර විය. ''කුඩා ට්‍රක් රථයක් ඉදිරියට ඇදෙමින් පොල්, කෙසෙල්ගෙඩි, සහ වතුර බෝතල් බෙදන අවස්ථාවක මිනිසුන් ක්ෂනිකව පෝලිම් ගැසෙනු දක්නට ලැබිනි. මෙය රජයේ වාහනයක් හෝ ජාත්‍යන්තර ඒජන්සියකින් මෙහෙයවන ලද වාහනයක් නොවේ. මෙය ප්‍රදේශයේ ව්‍යාපාරිකයෙකුගේ පෞද්ගලික උත්සාහයකි. ප්‍රාදේශීය සංවිධාන හා ප්‍රජා මධ්‍යස්ථාන මෙම තත්වයට මුහුන දීම සඳහා තමන්ගේ උපරිම උත්සාහයෙන් ක්‍රියා කල ද එය කොහෙත් ම ප්‍රමානවත් වී නැත.''

ඉරු දින කොලඹ හා ගාල්ල අතර මගීන් 1000ක් පමන ගමන්ගත් දුම්රියක් සම්පූර්නයෙන්ම රල පහරට ගසාගෙන ගොස් ඇත. මිය ගිය අයගෙන් බොහෝ දෙනෙකු රල පහරින් බේරීම සඳහා අමාරුවෙන් දුම්රිය මැදිරිවල වහලට නැගගත් එම ප්‍රදේශයේ වැසියන් ය. බ්‍රිතාන්‍ය පදනම් කර ගෙන ප්‍රසිද්ධ කෙරෙන *ටෙලිග්‍රාෆ්* පත්‍රයේ වාර්තාවක එම දර්ශනය විස්තර කර තිබුනේ මෙසේ ය. ''අඟහරුවාදා ඇද වැටී තිබුනු පොල් ගස් සහ සුන්බුන් මැද දිය පිරුනු දිය කඩිත්තක මල බැඳුනු දුම්රිය මැදිරි 8ක් පෙරලී තිබුනි. රල පහරින් දුම්රියේ රෝද කීපයක් කැඩී විසි වී ගොස් තිබුනු අතර රේල් පාරවල් ඇඹරී ගොස් තිබුනි. බොහෝ මල සිරුරු ඉවත් කොට තිබුනි. එහෙත් නරක් වෙමින් තිබුනු මල සිරුරු 15ක් දක්නට ලැබුනි. ගමන් බඩුබාහිරාදිය රේල් පාර දිගේ විසිරී තිබුනි. ඒ අසල පාසලක් විශාල වසයෙන් විනාශවී තිබුනි.''

රටේ උතුරේ සහ නැගෙනහිර ද විශේෂයෙන් එල්ටීටීඊය විසින් පාලනය කෙරෙන ප්‍රදේශවල තත්වය පැහැදිලි නැත. ත්‍රිකුනාමලයේ 30,000ක් මිනිසුන් අනාථ වී ඇති බවට ගනන් බලා තිබේ. *ටෙලිග්‍රාෆ්* වාර්තාවට අනුව ''සරනගත තත්වයේ රැකවරනය ලැබෙන බවට පෙර නිමිති තිබෙන්නේ මඳ වසයෙනි.'' මඩකලපුව ප්‍රදේශයේ පාර්ලිමේන්තු මන්ත්‍රිවරයෙකු වන එස්. ජෙයනන්දමූර්තී ටැමිල්නෙට් වෙබ් අඩවියට ප්‍රකාශ කර සිටියේ ''අලුතින් සාදා නිම කර තිබූ රෝහල, ප්‍රසිද්ධ ගොඩනැගිලි, පාසල්, දේශපාලන පක්ෂ කාර්යාල, නිවාස, පල්ලි, සහ කෝවිල් සියල්ල මුහුදු රල පහරින් විනාශ කොට ඇති'' බවයි.

ජනාධිපතිනී චන්ද්‍රිකා කුමාරතුංග සිකුරාදා ජාතික ශෝක දිනයක් බවට ප්‍රකාශ කොට ඇති අතර ඇයගේ ආන්ඩුව සුනාමි රල පහරින් අනාථවූවන්ට පිසින ලද ආහාර වේලක් සහ එක් සතියකට වියලි සලාක දෙන බව ට ප්‍රතිඥා දී තිබේ. මෙම මූලික සහනාධාරය පවා බොහෝ ප්‍රදේශවලට ලැබී ඇත්තේ ම නැත. එල්ටීටීඊයට අනුව ''පුද්ගලයින් 8000ක් මිය ගොස් හා මිලියන භාගයක් අවතැන් වී ඇති බවට ඇස්මේන්තු කොට ඇති තම ප්‍රදේශවලට කිසිම ආධාරයක් ලඟා වී නැත.'' (බලන්නඃ ශ්‍රී ලංකාවේ සුනාමියට ගොදුරු වූවෝ ලෝක සමාජවාදී වෙබ් අඩවියට කථා කරති)

## ඉන්දුනිසියාව

ඊයේ රාත්‍රියේ සුමාත්‍රාවේ උතුරු කෙලවරේ පිහිටි අසේ ප්‍රදේශයේ නිල වසයෙන් ප්‍රකාශකරන ලද මරන සංඛ්‍යාව 7,000 ඉක්මවයි. කෙසේ වුවද මෙම සංඛ්‍යාව 25,000 ඉක්මවිය හැකි බවට උප ජනාධිපති ජෝශප් කල්ලා ඊයේ අනතුරු ඇඟවීය. සම්පූර්න ප්‍රදේශයම පසුගිය වසරේ මැයි මස සිට හමුදා පාලනය යටතේ තිබුන ද බටහිර වෙරලේ ඉමහත් ව්‍යසනයට පත් ප්‍රදේශ යුද හමුදා ගුවන් යානයකින් පලමු වතාවට සෝදිසි කලේ ඊයේ යි.

ප්‍රවෘත්ති වාර්තා බොහෝ දුරට මහා භූමි කම්පාවට සෘජුවම ගොදුරු වූත් ඉනික්බිතිව උදම් රල පහරට ගොදුරු වූත් ප්‍රාදේශීය අගනුවර වූ බන්ඩා අසේ ප්‍රදේශයට සීමා විය. ඊයේ ඕස්ට්‍රේලියානු පුවත්පත තත්වය විස්තර කලේ මෙසේ ය. ''නරක්වෙමින් තිබෙන මල සිරුරු වීදි වල ගොඩගැසී ඇත. තැන තැන කුනුවෙමින් තිබුනු මත්සයින්ගෙන් වහනයවන දුගඳ පැතිරී යයි. මධ්‍යයේ ගොඩනැගිලි කීපයක් හානියට පත් නොවී ඉතිරිව පවතී. පදික වේදිකාවන් හරහා මැරුනු කුඩා මසුන් විසිරී තිබුනු අතර නගරයේ විශාල කොටසක් විනාශකල මුහුද අයිනේ මැරුනු කුඩා මසුන් ගොඩ ගැසී ඇත. ආහාර හා ජලය සැපයීම හීන වෙමින් තිබෙන අතර විදුලිබලය හෝ ඉන්ධන කොහෙත් ම නැත. බලාපොරොත්තු සුන් වූ බව වර්ධනය වෙමින් පවතී.''

පසුගිය වසරේ මෙම ප්‍රදේශය හදිසිනීති පාලනයක් යටතට පත්වීමෙන් පසු ප්‍රදේශයේ ජනතාවට හා බෙදුම්වාදී ගරිල්ලන්ට විරුද්ධව දියත් කෙරුනු පෘථුල මර්දනය පිලිබඳ ප්‍රවෘති යටපත් කිරීම සඳහා හමුදාව විසින් මාධ්‍යවලට සහ විදේශ ආධාර සේවකයන්ට ද දැඩි තහංචි පනවන ලදි. පලාතේ බොහෝ ප්‍රදේශවල ව්‍යසනය ඉතා බරපතල වුව ද ආන්ඩුව ආධාර සේවකයන්ට විරුද්ධව පනවා තිබුනු තහංචිය ඉවත් කලේ ඊයේ ය. මෙම ව්‍යසනයට යුද හමුදාවේ ප්‍රතිචාරය සීමිත සහ සැලසුම් සහගත නො වූවා පමනක් නොව යම් අවස්ථාවල අලස ස්වරූපයක් ගෙන ඇති බව බන්ඩා අසේ ප්‍රදේශයෙන් ලැබෙන මාධ්‍ය වාර්තා විස්තර කරයි.

## ඉන්දියාව

ඉන්දියාවේ නිල වසයෙන් ප්‍රකාශයට පත් කරන ලද මරන සංඛ්‍යාව ඊයේ වන විට 11,500ක් දක්වා වැඩි විය. මෙයින් අඩකට වැඩි ප්‍රමානයක් වාර්තා වන්නේ භූමිකම්පාවෙන් පසු ඇති වූ පශ්චාත් කම්පනවලට ලක් වූ පහත් බිම් ප්‍රදේශවන අන්දමන් දූපත් සහ නිකොබා දූපත්වලිනි. *සිඩ්නි මෝනිං හෙරල්ඩ්* පුවත්පතට අනුව ''එකී දූපත්වල අඩු වසයෙන් 7,000ක් පුද්ගලයින් මිය ගොස් ඇත. කෙසේ වුවද 6,000ක් ජනතාව ජීවත්වන දූපත් දෙකක් සමග මෙතෙක් සම්බන්ධතා ඇති කර ගත නොහැකිව ඇත. මෙම දූපත්වල 30,000ක් පමන පුද්ගලයින් පිලිබඳව තොරතුරු ලැබී නැති බව කියවේ.''

*ඕස්ට්‍රේලියා* පත්‍රයට සෘජුව ලැබුනු වාර්තාවකින් විනාශය විස්තර කර තිබෙන්නේ මෙසේ ය. ''නිකොබා දූපතක් වන චොව්ඩ්‍රාහි 1,500ක් පමන වන ජනගහනයෙන් 1,000ක් මිය ගොස් ඇත. මුහුදු වෙරල ආරක්ෂන නිලධාරියකු ප්‍රකාශ කලේ 45,000 ජනගහනයක් වාසය කල වර්ග කිලෝ මීටර් 24ක් විශාල අතොලු හා (හිරිගල් දූපත්) වූ කර් නිකොබා හි මරන සංඛ්‍යාව 1,000ක් පමන විය හැකි බවයි. 'කර් නිකොබාහි ගොඩනැගිලිවලින් 80%ක් පොලවට සමතලා වී ඇත.' යනුවෙන් ඔහු ප්‍රකාශ කලේ ය. 'සමබිමක් වූ එහි ජනයාට ආරක්ෂාව සඳහා දිවීමට තැනක් නොවී ය. දිවි බේරාගත් තුවාලකරුවන් විශාල සංඛ්‍යාවක් ද සිටින බැවින් දැනට මරන සංඛ්‍යාව ගනන් ගැනීම අපහසු ය. කෙසේ වුව ද මරන සංඛ්‍යාව වාර්තා වී ඇති ප්‍රමානයට වඩා බෙහෙවින් වැඩි ය'.''

ඉන්දියාවේ මහා භූමි ප්‍රදේශයේ දකුනේ තමිල්නාඩු රාජ්‍යය විශාල වසයෙන් ව්‍යසනයට පත්වූ ප්‍රදේශය යි. සඳුදා රාත්‍රිය වනවිට මල සිරුරු 3,720ක් සොයා ගෙන තිබුනි. වෙනත් ස්ථානවල මෙන්ම දරිද්‍රතාවයෙන් පෙලුනු ධීවර ගම්මාන බරපතල ලෙස ම ව්‍යසනයට පත්විය. මදුරාසියේ ප්‍රාන්ත රාජ්‍ය අගනුවර අසල ගමක ධීවර කාර්මිකයකු ප්‍රකාශ කලේ ''මම මගේ භාර්යාව, දුව, මගේ තාත්තා සහ සොහොයුරිය සමග මගේ දැලේ කුඩා මාලු ඉවත්කරමින් සිටින විට වතුර ආවා. දැන් මගේ පවුලම වතුරට ගහගෙන ගිහිල්ල.''

## තායිලන්තය

තායිලන්තයේ නිල වසයෙන් ප්‍රකාශයට පත්කොට ඇති මරන සංඛ්‍යාව 1,520කි. එහෙත් තවත් 1,400ක් දෙනා අතුරුදහන් වී ඇත. විශාල වසයෙන් ව්‍යසනයට පත් වී තිබෙන්නේ පූකට් සහ පහන් ගා සංචාරක නිකේතන ය. ඒවායේ විපතට පත් බොහෝ දෙනක් විදේශ සංචාරකයන් ය. දහස් ගනන් සංචාරකයින් ආරක්ෂක ස්ථානවලට හෝ රටෙන් පිටවී යැමට දරන උත්සාහයන් පෙන්වන ව්‍යාකුල දර්ශන මාධ්‍ය වාර්තාවලින් ප්‍රදර්ශනය විය. බොහෝ දෙනා කම්පනයට පත් වී තිබුනි. සමහරුන්ට තම ස්නේහවන්තයින් අහිමි විය. සෙස්සෝ උමතුවෙන්

අතුරුදහන්වූ තම පවුලේ සාමාජිකයින් සොයමින් සිටියහ.

ශ්‍රී ලංකාවේ මෙන්ම විශාල වසයෙන් සංචාරක ව්‍යාපාරය මත රඳාපවතින තායි ආර්ථිකයට මෙම ව්‍යසනය ක්ෂනිකව ම විශාල බලපෑමක් ඇති කරයි. රටේ දල ජාතික නිෂ්පාදනයෙන් 6%ක් ලැබෙන්නේ සංචාරක ව්‍යාපාරයෙනි. කුරුලු උන වසංගතය හා සාර්ස් රෝගය පැතිරීම තිබිය දී වුව ද මෙම වසරේ සංචාරකයින් පැමිනීම දශලක්ෂ 12ක් දක්වා වැඩිවී තිබුනි. හෝටල්වලින් බොහෝ ප්‍රමානයක් දැනට විනාශවී තිබේ.

මුහුදු වෙරල ප්‍රදේශවල ගැමියන්ට විදුලි බලය, ජලය, රැකවරනය වැනි මූලික අවශ්‍යතාවන් අහිමිව තිබේ. ''ප්‍රධානම ප්‍රශ්නය වන්නේ රෝග පැතිරීම, සනීපාරක්ෂාව, ස්වසන සහ චර්ම රෝග, සහ මල සිරුරු හා සමග නොයෙක් කටයුතුවල නිරත මිනිසුන්ගේ සනීපාරක්ෂාවයි'' ජ්‍යෙෂ්ඨ සෞඛ්‍ය නිලධාරී විචායි ටියන් තැවෝන් අනතුරු ඇඟවීය.

අනෙකුත් රටවලින් ලැබෙන වාර්තා අතිශයින්ම සීමා සහිත ය. මලයාසියාවේ අඩුම වසයෙන් පුද්ගලයින් හැටපස් දෙනෙක් ද අසල්වැසි බුරුමයේ පුද්ගලයින් 90ක් ද මියගොස් ඇත. කුඩා දූපත් රාජ්‍යයක් වන මාල දිවයිනේ මරන සංඛ්‍යාව 55 දක්වා වැඩි වී ඇත. ඉන්දියන් සාගරය හරහා අප්‍රිකා නැගෙනහිර වෙරලට සුනාමි රල පහර වැදුනු බැවින් සෝමාලියාවේ, සීශෙල්ස් හා ටැන්සානියාවේ අඩුම වසයෙන් 122ක් මියගොස් තිබේ.

© www.wsws.org